**විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහය වීමේ ව්‍යාපෘතිය (ශිවිසුම් අංක - 0486 එස්ආර්අයි) - 2023**

---

විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහය වීමේ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක 0486-එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ප්‍රදාන ගිවිසුම අනුව, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලි පුද්ගලික සමාගම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. බස්නාහිර පලාතේ පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදාහැරීමේ පද්ධතියක් ඉදිකිරීම හරහා දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීමට සහය වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදාහැරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම නම් වූ සංරචකයක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 268.36 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 1.8 වන අතර මුළු මුදලම ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2017 ජූනි 29 දින ආරම්භ කරන ලද අතර, 2021 සැප්තැම්බර් 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපාතිය අවසන් කරන දිනය 2022 සැප්තැම්බර් 30දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 මතය

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳවපාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරික්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම සහ මොරටුව විශ්වවිද්‍යාලය අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුම. | | | |
| (i) 7 වගන්තිය | අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් මාස 3 කට නොඅඩු කාලයක් තුල පාර්ශවයන් අතර අවබෝධතා ගිවිසුම පිළිබිඹු කරන ඒකාබද්ධ වැඩ නෛතික | අරමුදල් රැස් කිරීමේ හා බෙදාහැරීමේ යාන්ත්‍රණය, මෙහෙයුම් හා නඩත්තු කොන්ත්‍රාත්තු කළමනාකරණය, | අවබෝධතා ගිවිසුමේ ප්‍රතිපාදන අනුව ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතුය. අවබෝධතා ගිවිසුම 2018 ඔක්තෝම්බර් 16 දින අත්සන් කර තිබුණි, අවබෝධතා ගිවිසුම අත්සන් කළ දින සිට වසර 5 ක ප්‍රමාදයකින් යුතුව 2024 මාර්තු 27 වන දින ඒකාබද්ධ වැඩ නෛතික කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර තිබුණි. තවද, ඒකාබද්ධ වැඩ නෛතික කොන්ත්‍රාත්තුවක් අත්සන් කිරීමකින් තොරව ඉහත ව්‍යාපෘතිය 2022 සැප්තැම්බර් 02 දින නිම කර තිබුණි. | සූර්ය උත්පාදනය නෙට් ප්ලස් ගිණුමක් ලෙස පත් කිරීම සහ මිනුම් පද්ධතිය සැකසීම වැනි විවිධ සංරචක හේතුවෙන් අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද විය. | |
| (ii) 1. සහ 3.9. වගන්ති | ක්ෂුද්‍ර බෙදාහැරීම් පද්ධති නියමු ව්‍යාපෘතියේ දත්ත, මෙම ගිවිසුම යටතේ කරන ලද ඕනෑම පර්යේෂණ ව්‍යාපෘති ප්‍රගතිය පිළිබඳ කමිටුවේ අභිමතය පරිදි පොදුවේ සියලුම මහජනතාවට ලබා ගත හැකි වෙබ් අඩවියක් සංවර්ධනය කර පවත්වාගෙන යා යුතුය. පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා විද්‍යාගාරය භාවිතා කිරීමට උනන්දුවක් දක්වන රටේ අනෙකුත් විශ්ව විද්‍යාල, ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සහ වෙනත් පුද්ගලික සහ රාජ්‍ය ආයතන සමඟ සහයෝගීතාව පවත්වාගෙන යා හැකි මාධ්‍යක් ලෙස ද වෙබ් අඩවිය භාවිතා කල යුතුය. එසේ උවද, වෙබ් අඩවියක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | ක්ෂුද්‍ර බෙදාහැරීම් පද්ධති විද්‍යාගාරයේ නවතම වර්ධනයන් සමග වෙබ් අඩවියක් ඉදිරියේදී සකස් කෙරේ. | අවබෝධතා ගිවිසුමේ ප්‍රතිපාදන අනුව කටයුතු කල යුතුය. |
| (iii) 3.8 වගන්තිය | මෙහෙයුම් කමිටුව කාර්තුමය වශයෙන් රැස්වී මෙම ගිවිසුම යටතේ වන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අධීක්ෂණය කළ යුතුය. කමිටුව පත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා කාර්යබද්ධ ගිවිසුමක් සහ ක්‍රියාකාරී සැලැස්මක් නොමැති බැවින්, මෙහෙයුම් කමිටුවේ ක්‍රියාකාරකම් ඉතා සීමිත වූ අතර ඔවුන්ගේ මූලික අවධානය යොමු වූයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ආධාර ප්‍රදානය පිළිබඳ තීරණ ගැනීම පිළිබඳ පමණි. | අවබෝධතා ගිවිසුමේ ප්‍රතිපාදන අනුව මෙහෙයුම් කමිටුව ක්‍රියා කළ යුතුය |
| (iv) 3.10 වගන්තිය | කමිටුව සෑම වසරකම අවසානයේ ඉදිරි වසර සඳහා පර්යේෂණ යෝජනා රැස් කර පර්යේෂණ සැලැස්මක් සහ අයවැයක් සකස් කළ යුතුය. 2022 | කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර ඇති අතර පර්යේෂණ හා සංවර්ධන අරමුදල දැනටමත් ස්ථාපිත කර ඇත, ඒ අනුව | අවබෝධතා ගිවිසුමේ අවශ්‍යතාවය නොපමාව ඉටු |

| | | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය අවසන් කළද, ඉහත අවශ්‍යතාව සපුරා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 3.12 වගන්තියට අනුව ප්‍රධාන කාර්ය සාධන දර්ශක සාක්ෂාත් කර ගෙන නොතිබුණි. | පර්යේෂණ අයවැය වෙන් කරනු ලබන අතර අවබෝධතා ගිවිසුමට අනුව පර්යේෂණ යෝජනා සඳහා වන කැඳවීම විවෘතව ප්‍රසිද්ධ කෙරේ. | කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 වෙනත් කරුණු කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩ කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි සහ විශේෂ කොන්දේසි 13.3.3 වගන්තියට අනුව (පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදාහැරීම් පද්ධති නියමු ව්‍යාපෘතිය සැලසුම් කිරීම, සැපයීම සහ ස්ථාපනය කිරීම), කාර්ය සාධන බැඳුම්කරය ශුන්‍ය හෝ අවලංගු හෝ, නිම කිරීම සඳහා වෙන වෙනම කාලයක් සපයා ඇති විටදී කොන්ත්‍රාත්තු මිලට සමානුපාතිකව අඩු කිරීම, පහසුකම් සම්පූර්ණ කිරීමෙන් දින 540 කට පසු හෝ මෙහෙයුම් පිළිගැනීමෙන් දින 365 කට පසුව, යන්නෙන් පළමු අවස්ථාවේදී සිදු වේ.<br><br>සම්පූර්ණ කිරීමේ සහතිකය සහ මෙහෙයුම් පිළිගැනීමේ සහතිකය, පිළිවෙලින් 2022 සැප්තැම්බර් 02 සහ 2022 සැප්තැම්බර් 16 දින නිකුත් කර තිබුණි. තවද, මූලික කාර්ය සාධන බැඳුම්කරය 2022 පෙබරවාරි 28 දිනෙන් අවසන් වී තිබුණි. කෙසේ වෙතත්, 2022 පෙබරවාරි 28 වැනි දින සිට මෙහෙයුම් පිළිගැනීමෙන් (2023 සැප්තැම්බර් 16) දින 365 ක් වන කාලය දක්වා, කාර්ය සාධන බැඳුම්කරයේ කාලය දීර්ඝ කර නොතිබුණි. | විගණකගේ අදහස සමඟ එකඟ වේ. ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමෙන් පසු නැවත ගැටළු ඇති නොවනු ඇත. | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි සහ වැඩ කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි 13.3.3 ට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ආ) | කැබිනට් සංදේශය සහ ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතිය 2021 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වූ අතර, වැඩ කොන්ත්‍රාත්කරු විසින් සපයන ලද මූලික කාලසටහනට අනුව, ලෙකෝ ක්ෂුද්‍ර බෙදාහැරීම් පද්ධති නියමු ව්‍යාපෘතිය 2021 සැප්තැම්බර් 18 දින සහ ලෙකෝ පර්යේෂණ සහ සංවර්ධන විද්‍යාගාරය 2021 ජනවාරි 17 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණි.<br><br>කෙසේ වෙතත්, මූලික අපේක්ෂිත නිම කිරීමේ දිනයේ සිට මාස 11ක ප්‍රමාදයක් සහිතව, 2022 සැප්තැම්බර් 02 දින සම්පූර්ණ කිරීමේ සහතිකය නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය. | විගණකගේ අදහස සමඟ එකඟ වේ. ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමෙන් පසු නැවත ගැටළු ඇති නොවනු ඇත. | කැබිනට් සංදේශයේ සහ ප්‍රදාන ගිවිසුමේ අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කල යුතුය. |